# සර්ප දෂ්ටයකට ලක් වූ රෝගීන් අතුරින් වර්ජනීය රෝගීන් හඳුනා ගැනීම

පාරම්පරික වෛද්‍ය ඩබ්.වයි. සෝමපාල

සර්ප දෂ්ටයකින් පසු ප්‍රතිකාර සඳහා රැගෙන එනු ලබන රෝගීන් විවිධ සාධ්‍යතා මට්ටම්වල පවතී. දෂ්ට කළ සර්පයා, ශරීරගත වූ විෂ ප්‍රමාණය, විෂ පැතිරීමේ වේගය, ලබා දී ඇති ප්‍රථමාධාර යනාදී සාධක රෝගියෙකුගේ සාධ්‍යාසාධ්‍යතාවය තීරණය කිරීමෙහි ලා වැදගත් වේ. මේ අතුරින් බොහෝ රෝගීන් සඳහා යම් ප්‍රතිකාරයක් ලබා දීම ප්‍රයෝජනවත් වන අතර, ඇතැම් රෝගීන් සඳහා ප්‍රතිකාර යෙදීම නිෂ්ඵල වේ. එවැනි රෝගීන් හඳුනා ගන්නා ආකාරය සාකච්ඡා කිරීම මෙම ලිපියේ ප්‍රධාන පරමාර්ථය වේ.

**රෝගියා තුළ ප්‍රාණය පවතින බවට ලකුණු**

1. නාඩි වැටීම
2. ඉරටුවකින් පහර දුන් කළ වෛර පලු ගැනීම.
3. ඇඟිලි වටකුරු වී නියමල රතුපාට වී තිබීම
4. පපුවට එළඟිතෙල් ස්වල්පයක් දැමූ කළ උණු වී යාම
5. වීදුරු කැබැල්ලක් හෝ කණ්නාඩියක් රැගෙන රෝගියාගේ මුඛයට අල්ලා මඳ වේලාවකින් පරීක්ෂා කර බැලූ විට හුමාලය බැඳී තිබීම.
6. රෝමකූප ඇදීමේ දී ගැලවී නොයාම
7. ශරීරයේ උණුසුම ඇති බව
8. කළු ඉංගිරියාව (කණීනිකාවට පළල් නොවී තිබීම)

ප්‍රාණය පවතින, එහෙත් විෂ මූර්ඡා වී ඇති රෝගීන් හඳුනා ගැනීමට ඉහත ලක්ෂණ ප්‍රයෝජනවත් වේ.

**ප්‍රාණය රහිත රෝගීන් හඳුනා ගැනීම**

01. රෝම කෙළින් වීම
02. හිස කෙස් අවුල් වී විසිරී තිබීම
03. ඉරටුවකින් පහර දුන් විට වෛර පලු නොනැඟීම
04. පපුවට ගිතෙල් දැමූ කළ උණු වී නොයාම
05. මුඛය තුළ රතුපාට පිරී තිබීම
06. දැස් අඩවන් වී තිබීම
07. හනු තද වී තිබීම
08. නාඩි වැටීම නැවතී තිබීම
09. දෑත්-දෙපා ශීතල වී තිබීම
10. මළ/මුත්‍ර පිට වී තිබීම
11. මුඛය අසළ සෙම පිට වී තිබීම
12. කළු ඉංගිරියාව පළල් වී තිබීම

වෛද්‍යවරයා විසින් මෙවැනි රෝගීන් හඳුනාගෙන වර්ජනය කළ යුතුය.